# 2022.12.15 විශේෂ මහා සභා වාර්තාව

පාණදුර නගර සභාව

දිනය : 2022.12.15

වේලාව : පෙ.ව. 10.00

ස්ථානය : නගර සභා රැස්වීම් ශාලාව

සහභාගී වීම:

| | |
|---|---|
| ගරු සභාපති | - එම්.ඩී.නන්දන ගුණතිලක මහතා |
| ගරු උපසභාපති | - පී.එච්.විල්මන් මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | - රජීව සංජය වීරමන් මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | - අයි.ජානක උදයවර්ණ සොයිසා වික්‍රමසිංහ මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | - විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | - එම්.පියසේන ප්‍රනාන්දු මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | - කේ.ඩී.අශෝකා රත්නමාලි මිය |
| ගරු නාගරික මන්ත්‍රී | - කුමුදු ප්‍රනාන්දු මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | - කමල්සිරි ප්‍රනාන්දු මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | _ ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | _ එච්.ඩී.මහින්ද පුන්සිරි මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | _ පද්මා කොස්තා මිය |
| ගරු නාගරික මන්ත්‍රී | _ පුෂ්පා ෆොන්සේකා මිය |
| ගරු නාගරික මන්ත්‍රී | _ එච්.චන්දිම ඒ.පීරිස් මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | _ ගයා උදයංගනී ද සිල්වා මිය |
| ගරු නාගරික මන්ත්‍රී | _ ආර්.බන්දුල සොයිසා මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | _ එම්.පද්මසිරි සිල්වා මහතා |
| ගරු නාගරික මන්ත්‍රී | _ ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය |
| ලේකම් | _ ටී.මානෙල් සියඹලාගොඩ මෙය |

**සභාව පිළිගැනීම හා ආගම සිහි කිරීම**

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීමෙන් හා ආගම සිහිකිරීමෙන් පසුව මහා සභා රැස්වීමේ වැඩ කටයුතු පෙරවරු 10.00 ට ආරම්භ කරන ලදී.

**(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තා සම්මත කිරීම** - නැත

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන** - නැත

**(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා** - නැත

**(ඈ) සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම** - නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - නැත

**(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඊ.1) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා, ඉදිරිපත් කරන ලද යෝජනා**

**(ඊ.1.1)** නගර සභා ආඥා පනතේ 178 වගන්තිය යටතේ හා අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දාතමින් යුත් අතිවිශේෂ ගැසට් පත්‍රයේ 26 වන රීතිය මඟින් පනවා ඇති නියෝග අනුව සකස් කරන ලද සංවර්ධන,පරිපාලන හා සමාජ සුභ සාධන යෝජනා සහිත ආදායම් වියදම් ඇස්තමේන්තු ඇතුළත් පාණදුර නගර සභාවේ 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

**යෝජනා ස්ථිරත්වය :** ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

**අදහස් ප්‍රකාශ කරමින්:**

<u>ගරු සභාපතිතුමා</u>

2023 අයවැය සාරාංශය වශයෙන් අපේක්ෂිත පුනරාවර්තන ආදායම රු 346,597,750.00 ක්ද අපේක්ෂිත පුනරාවර්තන වියදම රු 337,783,410.00 යි.ඒ අනුව පුනරාවර්තන වියදමට වැඩි වූ පුනරාවර්තන ආදායම රු 8,814,340.00 යි.අපේක්ෂිත ප්‍රාග්ධන වියදම රු 8,919,200.00 යි.ඒ අනුව පුනරාවර්තන වියදමට හා ප්‍රාග්ධන වියදමට පසු අතිරික්තය රු - 104,860.00 යි.මෙහෙයුම් ක්‍රියාකාරකම් උත්පාදනය වූ අතිරික්ත මුදල් ප්‍රවාහයෙන් අපේක්ෂිත ප්‍රාග්ධන ලැබීම රු 2,400.00 යි. වත්කම් අපහරණයෙන් ලද මුදල් රු 150,800.00 යි.ඒ අනුව අයවැය අතිරික්තය රු 48,340.00 යි.

මේ පිළිබඳව පනතේ විධිවිධාන අනුව අවසන් වශයෙන් ඒකාබද්ධ කාරක සභාවක් කැඳවූ අතර ඒ සඳහා සියළුම සභික මහත්ම මහත්මීන්ට ආරාධනා කළා.ඒ අනුව කාරක සභා රැස්වීම සඳහා එදින සභික මහත්ම මහත්මීන් 11 දෙනෙකු සහභාගි වුණා.එහිදී එම සභික මහත්ම මහත්මීන් කිසිදු සංශෝධනයකින් තොරව මෙම අයවැය ලේඛණය ඉදිරියට ගෙනයාමට නිර්දේශය ලබාදී තිබෙනවා.ඒ අනුවයි අද දින අයවැය ලේඛණය ඉදිරිපත් කරනු ලබන්නේ යැයි පවසා සිටින ලදී.

මෙම සභා වාරය සඳහා වසර 05 කට ආසන්න කාලයක් මේ අවස්ථාව වන විට ගතවී තිබෙනවා.මේ දක්වා කාලය තුළ කොරොන් වසංගතය ,ආර්ථික අර්බුදය වැනි බාධක තිබුණද සභාවක් ලෙස පාණදුර නගර සභාව විශාල ප්‍රගතියක් අත්කර ගෙන තිබෙනවා.2022 ජනවාරි සිට මේ දක්වා ආදායම වියදම සලකා බැලූවිට ආදායමට වඩා වියදම වැඩියි.එසේ වුවද මේවන විට සභාව ස්ථාවර තැන්පතු වශයෙන් ලක්ෂ 1300 ට වැඩි ප්‍රමාණයක් පවත්වාගෙන යාමට සමත් වී තිබෙනවා.ඒ අනුව එමඟින් පොළිය ලෙස මාස 03 ට වරක් ලක්ෂ 83 ක් පමණ ලැබෙනවා.එයද සභාවේ මේවන විට ඇති ප්‍රධාන ආදායමක් ලෙස සැලකිය හැකි අතර රටේ වෙනත් කිසිදු සභාවක මෙවන් ආදායමක් නැහැ.මෙසේ තැන්පතුවක් සහිත සභාවක් ලෙස පවත්වාගෙන යාමට හැකි වී තිබෙන්නේ මේ සභාවේ සියළු සභිකයින්ගේ සහයෝගයෙන් නිසි කළමනාකරණයකින් යුතුව වැඩකටයුතු ඉටු කළ නිසයි.තවද මෙම ස්ථාවර තැන්පතු වශයෙන් තැන්පත් කර ඇත්තේ වැඩි වශයෙන්ම සභාව වෙත ලැබෙන්නාවූ මුද්දර ආදායමයි.එම මුදල් නාස්ති කිරීමක් සිදු නොකළ අතර අනවශ්‍ය ප්‍රාග්ධන වියදම් සිදුකළේ නැහැ.එහිදී නගරයේ සංවර්ධනය කටයුතු ඉටු කිරීමේදී සභාවේ මුදල් වැයකිරීමකින් තොරව ඒ සඳහා මධ්‍යම රජයෙන් විශාල සහයෝගයක් ලබාදුන්නා.ගම්පෙරළිය වැඩසටහනින් ලක්ෂ 700 ක පමණ මුදලක් යොදවා තිබෙනවා නගරයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමට.එපමණක් නොවෙයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය එක්ව ආණ්ඩු කළ යහපාලන ආණ්ඩුව සමයේදීත් හිටපු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමා හරහාත් විශාල මුදල් ප්‍රමාණයක් නගරයේ සංවර්ධන කටයුතු සඳහා ලැබුණා.ඒ තත්ත්වය මත තමයි මුද්දර ආදායම අනවශ්‍ය ලෙස වියදම් නොකර මේ බල ප්‍රදේශයේ ඉදිරි අනාගතය සඳහා අවශ්‍ය අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීමට ඉතිරි කළ හැකිවුණේ.ඒ පිළිබඳව සභාවක් ලෙස සතුටු විය හැකියි.

කොරෝනා අර්බුදය හේතුවෙන් වැඩ කටයුතු කිරීම අපහසු වුණා.නමුදු සෞඛ්‍ය අංශයේ හා කර්මාන්ත අංශයේ සේවක මහතුන්ගේ හා ඉහළ නිළධාරීන්ගේ කැපවීම නිසා නගර සභා සීමාවේ ජනතාවගේ දෛනික අවශ්‍යතා ඉටු කර දීම යන කාරණයේදී ප්‍රශස්ත මට්ටමකට කළ හැකි වුණා.එසේ කළ හැකිවුණේ ලේකම්තුමියගේ සිට පහළට කාර්යය මණ්ඩලයේ සියළු දෙනා කැපකිරීමකින් යුතුව තමන්ගේ වගකීම් රාජකාරි කටයුතු ඉටු කළ නිසයි.කාර්යයන් ඉටු කිරීමේදී අසීරුම කාර්යය වුණේ කාණු පිරිසිදු කිරීමයි.නමුදු මේවන විට ප්‍රධානම කාණු ටික පිරිසිදු කර තිබෙනවා.ඊයේ රාත්‍රියේ ආතර් වී දියෙස් මාවතේ කාණු පිරිසිදු කිරීම් සිදුකළ අතර ඉන්පසු මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එකතුවී ගාලු පාරේ කාණු පිරිසිදු කිරීමට කටයුතු යොදා තිබෙනවා.කාණු පිරිසිදු කිරීමේ කටයුතු බාධාවන් හේතුවෙන් නිසි අයුරින් ඉටු කිරීමට නොහැකි වුණා කියන ස්වයංවිවේචනයක් තිබෙනවා. නමුදු රටේ පැවති තත්ත්වත් එක්ක සාපේක්ෂව බරපතල පැමිණිලි ඉදිරිපත් නොවන මට්ටමට එය ඉටු කළා.නගර සභාවට පවතින ලොකුම පැමිණිල්ල තමයි වර්ෂා ජලයෙන් නගරය යටවීම වළක්වා ගැනීමට නොහැකි වීම.

නගරයේ පොදු වෙළඳ පොළ ඉදිකිරීම වෙනුවෙන් ලබන වසරට මිලියන 500 ක මුදලක් මේ වන විට වෙන්කර තිබෙනවා.එමනිසා තාවකාලිකව නතර කර ඇති එහි ඉදිකිරීම් ජනවාරි සිට ආරම්භ කළ හැකියි.එමනිසා නගරයේ තිබූ එක් ගැටළුවකට විසඳුමක් ඒ ආකාරයෙන් ලබන වසරේදී යම් ආකාරයකට විසඳීමට හැකියාව ලැබී තිබෙනවා.මෙහිදී පැවති ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර එහි සිටි වෙළඳුන්ට තාවකාලික කඩ කාමර සකසා දීමේ ව්‍යාපෘතියක් ඉතා සාර්ථකව ඉටු කළ අතර මේවන විට එහි වෙළඳුන් කිසිදු ගැටළුවක් නොමැතිව වෙළඳාම් කටයුතු කරගෙන යනවා.

නගරය වර්ෂා ජලයෙන් යටවීම සම්බන්ධයෙන් ගත්විට ,නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටි සංවර්ධන වැඩසටහන් යටතට නගරයේ සංවර්ධන කටයුත්තක් වශයෙන් ඒ පිළිබඳව දන්වා යවා තිබෙනවා.එමෙන්ම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පැමිණ සභා ගොඩනැගිලි පරීක්ෂා කර ඔවුන්ද පවසා තිබෙනවා යම් මුදලක් සභාව වෙත වෙන්කර ලබාදෙනවා

කියා.එමනිසා ඉදිරියේදී නගරයේ ගැටළු වශයෙන් පැවති දේවල් වලට යම් විසඳුමක් ලැබිය හැකියි.

දෛනික වැඩ කටයුතු කිරීම සම්බන්ධයෙන් ගත්විට පසුගිය වසර 04 පුරාවට එක් එක් කොට්ඨාශයන්හි මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත සිදුකරන ලද සියළු කාර්යයන් පිළිබඳව වාර්තා සකස් කර තිබෙනවා.එමෙන්ම නගර සභා ප්‍රාග්ධන අරමුදල් යොදවා සිදුකරන ලද සියළු කාර්යයන් පිළිබඳ වාර්තාවක්ද සකස් කර තිබෙනවා.එම වාර්තා සලකා බැලීමේදී මෙම සභාව නියෝජනය කරන සියළු සභිකයන්ට කුමන හෝ මුදල් ප්‍රමාණයක් ලබාදී තිබෙනවා තම කොට්ඨාශයන්හි වැඩකටයුතු ඉටු කිරීමට.එහිදී දේශපාලන හේතුවක් මත සභාවේ මේවන විට නොමැති අනුර විජයපාල මන්ත්‍රීතුමාටත් දැනට ජීවතුන් අතර නොමැති සුමනදාස මන්ත්‍රීතුමාටත් ඒ ආකාරයෙන්ම මුදල් වෙන්කර ලබාදී තිබෙනවා.එම නිසා පක්ෂ භේදයකින් තොරව සභාවේ සිටින සියළුම ගරු මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට සාධාරණය හැකි පමණ ඉෂ්ට කර තිබෙනවා.මැතකදී අඩුආදායම් දරුවන්ට ශිෂ්‍යාත්ව ලබාදුන් අතර එහිදීත් පක්ෂ භේදයකින් තොරව සියළුම සභිකයින්ට අවස්ථාව දුන්නා.මෙසේ අනෙක් සභාවන් වල විපක්ෂයට අවස්ථාව ලබාදෙන්නේ නැහැ.මෙම සභාවේ එසේ සිදු නොවන අතර පාලක පක්ෂයේ සභිකයින් විපක්ෂයට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් කිසිවිටක විරුද්ධ වීමක් සිදුවූවෙත් නැහැ.

පසුගිය වසරේ අප්‍රේල් මාසයේ සිට ආණ්ඩුව විසින් යම් සීමාවක් පැනවූවා සංවර්ධන වැඩ නතර කිරීමට හා බඳවා ගැනීම් නතර කිරීමට.සේවක බඳවා ගැනීම් තවත්මත් සිදුකළ නොහැකියි.නමුත් පසුගිය ඔක්තෝබර් මස සිට ආපදා තත්ත්වයන් අවම කිරීමට ඉටු කළ යුතු සංවර්ධන වැඩ පමණක් ඉටු කිරීමට ලිහිල් බවක් ලබාදුන්නා.ඒ අනුව කර්මාන්ත කමිටු වාරයකදී හා සභා වාරයකදී පවසා සිටියා එවන් ආපදා තත්ත්වයන් පිළිබඳව ඡායාරූපද සහිතව නැවත යෝජනා ඉදිරිපත් කරන ලෙස.ඒ අනුව සමහර සභිකයින් යෝජනා ඉදිරිපත් කළා.ඒ අනුව යම් ව්‍යාපෘතීන් සංඛ්‍යාවක් ඉටු කළා.තවත් කිහිපයක් තිබෙනවා ඇස්තමේන්තු සකස් කර ගිවිසුම් අත්සන් කිරීමට තිබෙන.සමහර අවස්ථා තිබිය හැකියි හිත්රිදවීම් ඇතිවෙච්ච වැඩ නොකෙරුනු අවස්ථා.නමුදු සමස්ථයක් ලෙස මෙම සභාව ආණ්ඩු පක්ෂය ,විපක්ෂය ලෙස භේදයක් නොමැතිව මේ දක්වා කටයුතු කර තිබෙනවා.

කාර්යක්ෂම වැඩ කර ගැනීමට ලොකු උත්සහයක් ගන්නවා.කවුරුත් දන්නව පහළ සේවක මහත්ම මහත්මීන් වැඩ කරන ආකාරය පිළිබඳව.කොපමණ උත්සහ කළත් නිදන්ගත රෝගයක් ලෙස දවල් 12 න් පසු කවුරුන් හෝ වැඩ බිමට පරීක්ෂා කරන්න නොගියොත් ඔවුන් සේවය කරන්නෙ නැහැ.මෙය සෑම සභාවකම පවතින පොදු ගැටළුවක් වී තිබෙනවා.මෙම ගැටළුවට පිළියමක් ලෙස යෝජනා කළා තමන්ගේ කොට්ඨාශයේ යම් වැඩක් ඉටු කරන විට කොට්ඨාශයේ සභිකයාට එහි රැදී සිටින්න කියා.ඒ ඉල්ලීම අනුව පෙරට වඩා සභිකයින් ඒ වෙනුවෙන් මැදිහත් වුණා.

මෙසේ සභාව තිබුණු තැනට වඩා ඉහළට රැගෙන විත් තිබෙනවා.අපි එන විට මෙම සභාව පැවතියේ සේවකයින්ට වැටුප් ගෙවිය නොහැකි,කිසිදු වාහනයක් නොමැති ලක්ෂ 200 ක් පමණක් ණයක් ඇති සභාවක් වශයෙන්.ඒවා සියල්ලම නිවැරදි කළේ සභාවෙන්ම සේවකයින් සොයා ගෙන.පුද්ගලිකව මැදිහත් වී සියළු දේ ඉටු කළ නොහැකියි.නමුදු හැකි අයුරින් ඉටු කළා.එමෙන්ම මහජනයාගෙන් පැමිණිලි ඍජුව යොමුකළ හැකි ලෙස වට්ස්ඇප්,වයිබර් වැනි දේ සකසා තිබෙනවා.දැන් පෙරට වඩා ජනතාව එම මාර්ගයන් ඔස්සේ ඔවුන්ගේ ගැටළු ඉදිරිපත් කරමින් හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යනවා.නගර සභාවට ලැබෙන්නාවූ මුදලට හැකිපමණින් ජනතාව වෙත සේවය ලබාදී තිබෙනවා.නමුදු ජනතාවගේ සියළු අවශ්‍යතාවයන් කිසිසේත් සභාවකට ඉටු කළ නොහැකියි.පසුගිය දිනක මාධ්‍ය වාර්තාවක් තිබුණා පාණදුර නගරය ගන්න දෙයක් නැහැ කැළි කසල ගොඩගැහිලා කියලා.නමුදු එවන් එක් ස්ථානයක්

පෙන්නන්න කියා එතුමාට පවසා සිටිනවා.සෞඛ්‍ය සේවකයින් කැපවීමෙන් වැඩකරනවා.හැබැයි සීයට සියයක් නගරය එකවර පිරිසිදු කිරීමට සභාවට නොහැකියි.සභාවට කටයුතු කළ හැක්කේ සභාවේ ධාරිතාවෙන් හා සිටින්නා සීමිත සේවක සංඛ්‍යාවක් යොදවමින්.එමනිසා දෝෂාරෝපණ මධ්‍යයේ බරපතළ දෝෂාරෝපණ නැති තත්ත්වය මේ සභාව මේවන විට පවත්වාගෙන යනවා.සභාවක් ලෙස ආඩම්බර විය හැකි අතර.එසේ විය හැක්කේ පහළම සේවකයින්ගේ කැපවීම හා සභිකයින්ගේ මැදිහත්වීම ඇතුළු සියළු දෙනාගේම කැපකිරීම මතයි.

මෙම අයවැය වෙනත් සභාවක අයවැයක් ලෙස නොසලකන අතර ඉදිරි දියුණුවක් ලද ශක්තිමත්ව තිබෙන ආයතනයක් ඉදිරිපත් කරන අයවැයක් මෙය.මෙහි අවශ්‍ය කටයුතු වලට හැකි ප්‍රමාණයන්ගෙන් මුදල් වෙන්කර තිබෙනවා.ප්‍රාග්ධන වියදම් වශයෙන් සෘජුව ලක්ෂ 89 ක් පමණ වෙන්කර තිබෙනවා.ඊට අමතරව ලබන වසරේ තවදුරටත් මුද්දර ආදායම ලැබීමට නියමිත බැවින් ස්ථාවර තැන්පතුවක් ලෙස පවතින මුදලින් යම් කොටසක් ලබාගනිමින් අවසන් කළ යුතු ගොඩනැගිලි සාදා අවසන් කිරීමට කටයුතු කළ හැකියි.එමනිසා මෙම අයවැය සම්බන්ධයෙන් දේශපාලන විරෝදයක් හැර වෙනත් හේතුවක් මත විරුද්ධ වීමට අවස්ථාවක් නැහැ.ඒනිසා දේශපාලන භේද පසෙකින් තබා සියළු දෙනා එක්ව මෙම සභාව ඉදිරියට ගෙනයාමට ශක්තිය ලබාදෙන්න කියා පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී පද්මා කොස්තා මිය</u>

තව මාස 02 කින් හෝ 03 කින් මෙම සභා වාරය අවසන් වීමට ඉඩ තිබෙනවා. වසර 04 කට වැඩි කාලයක් අප සභාවෙහි රැඳී සිටිය අපට,අපේ කොට්ඨාශවලට වැඩ කරන්නතවත් ඇත්තේ මාස දෙක තුනක කාලයක් විය හැකියි.ජනතාවගේ ඡන්දය ලබාගෙන අපි මෙතනට ආවේ ඔවුන් වෙනුවෙන් ගම්මට්ටමින් වැඩ කරන්න.ජනතාවගේ වරිපනම් බදු මුදල් වලින් තමයි අප කටයුතු කරනු ලබන්නේ.පසුගිය කාලයේ ජනතාව වෙනුවෙන් වැඩ කළද තවත් දේ කළ යුතුව තිබෙනවා.ඡන්දය ලබාදී අපව ජනතාව මෙම සභාවට මේ වාරයේ එවා තිබෙන්නේ ඔවුන්ගේ ගැටළු තවත් වසර 05 කට තබා ගන්න නොවෙයි.එමනිසා ඉදිරියේදී ඡන්දයකට ඉදිරිපත් වෙනවාද නැවත මෙතනට එනවාද යන්න නොසිතා මෙම ඉදිරි මාස දෙක තුනේ ජනතාව වෙනුවෙන් වැඩ කිරීම මාගේ පරමාර්ථය බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

රටේ පැවති ආර්ථික තත්ත්වය මත ව්‍යාපෘති ඉටු කිරීම නවතාලමින් චක්‍රලේඛ නිකුත් වූ අතර මේවන විට එම තහංචි ලිහිල් කරමින් ව්‍යාපෘතීන් ඉටු කිරීමට අවස්ථාව දී තිබෙනවා.එම නිසා ස්ථාවර තැන්පතු ලෙස යොදා තිබෙන මුදල් හෝ යොදා ගනිමින් ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යයන් ඉදිරියේදී ඉටු කර අවසන් කළ හැකි බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මෙම 2023 වර්ෂයේ අයවැය ලේඛණයේ ලක්ෂ 3465 ක මුදලක් පුනරාවර්තන ආදායම ලෙසත් ලක්ෂ 3377 ක මුදලක් පුනරාවර්තන වියදම් ලෙසද දක්වා තිබෙනවා.මෙපමණ මුදලක් අපේ සභාවේ ඉදිරි කටයුතු සඳහා යොදවනවානම් මෙම නගර සභා සීමාවේ මාර්ග ,ඇළ මාර්ග හා කාණු පද්ධති ආදිය සකස් කර මෙම නගර සභා සීමාව බැබළවිය හැකියි.තවද ලක්ෂ 1400 ට ආසන්න මුදලක් බැංකුවේ ස්ථාවර තැන්පතු වශයෙන් පවතිනවා.මෙම මුදල් වලින් වැඩි කොටස මුද්දර ආදායමින් ලද මුදල්.මෙම මුදල් වල ගෞරුත්වය ලබාදිය යුත්තේ ලේකම්තුමියටත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ගොස් එම මුදල් ලබාගැනීමට යොමුවන නිළධාරීන්ටත් එම අංශයටත්ය.

පසුගිය වර්ෂයන්හි අයවැය අවස්ථාවන් වලදීත් අපි අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරා.මන්ද එය පක්ෂයෙන් ගන්නා වූ තීන්දු තීරණ.එම තීරණ වලට අපට විරුද්ධ විය නොහැකියි.පාර්ලිමේන්තුව තුළද මෙවන් දේ සිදු වෙනවා.නමුත් අවසානයේ සියළු දෙනා සතුටුන් කතා බහේ යෙදෙනවා.එමනිසා ගරු සභාපතිතුමාට විරුද්ධ වීමක් නොවෙයි සිදුවන්නේ,දේශපාලනමය වශයෙන් තීන්දු තීරණ ගන්නා බැවින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම අයවැයටද විපක්ෂව අතඔසවන්න සිදු වෙනවා.ඉදිරියේදී මේ රටේ සියළු කර්තවයන් සිදුකරන්න වන්නේ මැතිවරණ වලින්.මීළඟට පැමිණීමට නියමිතව තිබෙන්නේ ජනාධිපතිවරණයක්.එමනිසා ඒ දක්වා මෙම සභාවන්හි කාලය දීර්ඝ කිරීම සිදුවිය හැකියි නැතිනම් තව මාස දෙක තුනකින් සභාවන් විසුරුවා හැර කොමසාරිස් පාලනයක් යටතට පත්කිරීමටද ඉඩ තිබෙනවා.

කෙසේ වෙතත් ඒකාබද්ධ කාරක සභාවේදී අයවැය සඳහා කිසිදු විරුද්ධත්වයක් නොදැක්වූවද දේශපාලනමය වශයෙන් පක්ෂයේ තීරණයන්ට අනුව මෙම අයවැයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් නැහැ.එමනිසා අයවැය සඳහා බෙදීමක් ඉල්ලා ඡන්දය විමසීමේදී අත ඔසවා තම ඡන්දය ලබාදීමට කටයුතු කරන ලෙස සියළු සභිකයින්ගෙන් ඉල්ලා සිටින බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා</u>

ගරු සභාපතිතුමාගේ අදහස් ප්‍රකාශ කිරීම අප අගය කරනවා.තමාද 2011 වර්ෂයේ සිට මෙම සභාවේ ගරු සභාපතිතුමා සමඟ මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරනවා.එදා ණය බරින් මිරිකුණු සභාවක් තමයි ගරු සභාපතිතුමා බාරගත්තේ.එහිදී විපක්ෂයක් වශයෙන් අපද ඔබතුමාට මෙම සභාව ගොඩගැනීම සඳහා නගරය සංවර්ධනය කිරීම සඳහා සහය දැක්වූවා.අද දින ඉදිරිපත් කරන ලද අයවැය ,සංවර්ධිත අයවැයක් මෙන්ම දැක්මක් තිබෙන අයවැයක් බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා</u>

මෙම අයවැය සම්බන්ධයෙන් වූ ඒකාබද්ධ කාරක සභා රැස්වීම සඳහා අපද පක්ෂයක් වශයෙන් සහභාගී වුණා.නමුදු පසුව මේ අයවැය පිළිබඳව පක්ෂයක් වශයෙන් සාකච්ඡා කිරීමේදී අපව ඒ සඳහා කැඳවා ගැනීමක් සිදුවුණේ නැහැ.මෙම අයවැය ලේඛණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචනයේදී නල්ලූරුව පිළිබඳව අදහස් දැක්වූවා.හිටපු නාගරික මන්ත්‍රී සුමනදාස ප්‍රනාන්දු මහතාට ගම්පෙරළියෙන් මුදල් ලැබුණු අතර ඒ මුදල් සියල්ල කළමනාකරණය කරන ලද්දේ තමන් බවත් එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් ගරු සභාපතිතුමා විසින් ඒවා බෙදා දුන් බවත් පවසා සිටින ලදී.එසේ තමයි නායකයෙකු අනුගාමිකයින්ව ඉදිරියට අරගෙන යන්නේ.

ජයන්ති මාවත සම්බන්ධයෙන් ගත්විට එය අළුත්වැඩියා කර ලබාදෙන ලෙස සභාව වෙත ලිඛිත ඉල්ලීම් සිදුකළා.එය සිදුකර දුන්නා.එය සත්‍යයක්.අපි බලය ඉල්ලන්නේ වැඩකරන්න.ජනතාව බලය දෙන්නේ උඹල වැඩ කරපල්ලා කියලා.ඉන් පිටස්තර දෙයක් නැහැ.ගරු සභාපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හයවෙනි කරුණ වශයෙන් දක්වා තිබෙන්නේ නල්ලුරුව සුසාන භූමියේ ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සිදුකරන බව.ජානක මන්ත්‍රීතුමා සමඟ එකතු වී තමා නල්ලූරුව සුසාන භූමිය කොටස් 04 කට වෙන්කර එහි වයඹ කොටසත් ගිණිකොණ දිග කොටසත් නිරිත දිග කොටසේ භාගයක් පිරිසිදු කිරීමටත් කටයුතු කළා.ඊසාන දිග කොටස පිරිසිදු කර ගැනීමට නොහැකි වුණා.එමෙන්ම එම සුසාන භූමිය වෙතට කම්කරුවෙකු ලබා දෙන ලෙස සභා වාර කිහිපයකදී ඉල්ලීම් කළා.ඉන්පසු කම්කරු මහතෙකු ලබාදුන්නද දවස් කිහිපයකින් එම සේවක මහතා පැමිණියේ නැහැ.මෙම සුසාන භූමියේ සොහොන්කොත් සියල්ල

ජනතාව ගෙන්වා ගනිමින් පිරිසිදු කර අතුරු පාරවල් සකස් කර මල් වවා සකස් කිරීමට තමා සතුව සැලැස්මක් තිබුණද එය කරගත නොහැකි වූ බව පවසා සිටින ලදී.

තම කොට්ඨාශයේ වැඩ වෙනුවෙන් තමා හට ලක්ෂ 08 ක ප්‍රතිපාදන ලබාදුන් අතර ඉන් ලක්ෂ 2 කට සමාන මුදලක් වෙන්කර ෆිනැන්ස්වත්තේ කාණුවක් ඉදිකරන ලදී.ඉතිරි මුදල් යොදවන ලද්දේ ඕබට් සිල්වා මාවතේ පැවති පැරණි පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා.එහි මේවන විට වැඩ අවසන් වී ඇති බව පවසා සිටින ලදී.

මාගේ දේශපාලන ගමන මීට වඩා හොඳින් සංවර්ධනය කරගෙන ඉදිරියට යනවා.ගියවර අයවැය අවස්ථාවේදී අයවැයට පක්ෂව ඡන්දය ලබානොදුන් බවට අපි වාචිකව ප්‍රකාශ කර තිබෙනවා.මෙවරත් අපව අයවැය සකස් කිරීමේදී සම්බන්ධ කරගත්තේ නැහැ.මෙම සභාවේ ප්‍රධානව ගරු සභාපතිතුමා හිටියත් පරිපාලනය මෙහෙයවනු ලබන්නේ ලේකම්තුමිය විසින්.එමනිසා ඇයට මෙම කටයුතු කරගෙන යෑම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.

අපි බලය ඉල්ලුවේ වැඩ කරන්න.වැඩකරන්නෙ නැතුව මෙතන සිටීමේ පළක් නැහැ.නායකයෙකු අනුගාමිකයන්ව දිනුම් කණුව කරා ගෙනයන්න කටයුතු කළ යුතුයි.මාගේ හෘදසාක්ෂියට අනුව එය සිදුවුණාද යන්න සැකයක් පවතිනවා.අවස්ථා දෙකකදී ගරු සභාපතිතුමා එක්ක සුහද කටයුතු කිරීමට ඉල්ලීමක් කළා.නමුදු එය කිසිදු ගණනකට ගත්තේ නැහැ.කෙසේ හෝ මෙම අයවැය ලේඛණය සැදීම සඳහා මහන්සි වූ සියළු දෙනාට ස්තූතිය පුදකරන අතර 2023 වසර සියළු දෙනාටම නිරෝගිමත් වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා</u>

අයවැය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ කතාවේදී  කොට්ඨාශයන් සඳහා කළ දේවල් පිළිබඳ පවසා සිටියා.නමුදු තමාගේ කොට්ඨාශය සඳහා යහපාලන ආණ්ඩුවෙන් ලබාදුන් දෙයින් කොටසක් සභාපතිතුමා විසින් තමන්ට ලබා දුන්නද මෙම සභාවෙන් කිසිවක් ඉටු කර දී නැහැ.අනේක වාරයක් සභාපතිතුමාට පවසා තිබෙනවා ප්‍රාදේශීය ලේකම්  සමඟ සාකච්ඡා කර කොට්ඨාශය සම්බන්ධයෙන් පවතින ගැටළුවට විසඳුමක් ලබාදෙන ලෙස.නමුත් එම ඉල්ලීම ගණන් ගත්තේ නැහැ.

එමෙන්ම වසරකට පමණ පෙර සභාවට යෝජනාවක් ඉදිරිපත් කරා සුනාමි නිවාස සංකීර්ණමාර්ගය,නොයෙල් මෙන්ඩිස් මාවත අළුත්වැඩියා කර දෙන ලෙස.නමුදු එම යෝජනාවක් හෝ සභාපතිතුමා ඉටු කර දුන්නේ නැහැ.ගරු සභාපතිතුමාගෙන් ඈත්වෙන්න හේතුවුනේ එවන් කාරණාවන්.සභාපතිතුමා තමා වෙත නාම යෝජනා ලබාදුන් නිසා තමයි ඡන්දයේදී තමාට ජයග්‍රහණයි කරන්න පුළුවන් වුණේ.නමුත් අපිව ජනතාව ඡන්දය ලබාදී සභාවට යවන්නේ ඔවුන්ගේ වැඩ ඉටු කර ගැනීමට.ඒ කිසිවක් ජනතාවට ඉටු වුණේ නැහැ.කාණුවක් පිරිසිදු කර ලබාදෙන ලෙස ඉල්ලූ විට ශ්‍රමදානයක් සංවිධානය කළා.ශ්‍රමදානයක් කවුරුවත් ඉල්ලා සිටියේ නැහැ.එමෙන්ම ශ්‍රමදානයට පැමිණියෙත් සභාවේ සේවකයින් දෙතුන් දෙනෙක් පමණයි.මෙවන් ගැටළු තිබියදී තමයි අපි ,සභාපතිතුමා සමඟ හිටගෙන ඉන්නේ.නමුත් ඔබතුමා අපිව ගණන් ගත්තේ නැහැ.අපි ඔබතුමා සමඟ කළින් ගිවිසුමක් ගැහුවා. වට්ස්ඇප් හරහා කතා කළා.නමුත් ඔබතුමා ඒවට පිළිතුරු දුන්නෙ නැහැ.එදා සිට තමයි මේ ආරවුල ඇතිවුණේ.ඔබතුමා මා දන්නා පමණින් සාමාන්‍යයෙන් නිහතමානී දේශපාලඥයෙක්.නමුදු ඔබතුමා අපට කළේ, අපේ ඡන්ද අරගෙන අපි පත්වුණාට පසු ඔබතුමා ඔය පුටුවට පත්වෙලා අනවශ්‍ය දේවල්.ඔබතුමාට තිබුණා අපිත් සමඟ එකතු වී යන්න.නමුදු ඔබතුමා එය කළේ නැහැ.ඔබතුමා එක් එක් අයගෙ කේලම් අහගෙන කටයුතු කළා.එවන් දේවල් වලින් අපි අසරණ වීම පමණයි සිදුවුණේ.

කොට්ඨාශයේ ජනතාව මගෙන් විමසා සිටින විට ඇයි මේව හැදුවෙ නැත්තෙ කියා මා පවසා සිටිනවා සභාපතිතුමාට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා නමුත් ඒවා ඉටු කළේ නැහැ කියා.දැන් වුණත් ඇවිත් බලන්න පුළුවන් හොරණ පාරෙන් යන්නාවූ කොටසත් නෙවිල් ප්‍රනාන්දු පාරෙන් යන්නා වූ කොටසෙත් තනිකර වළවල්.ඉල්ලීම් කරල හරියටම වසරක්.නමුත් එක ගල්කැටයක් දැම්මෙ නැහැ.කාපට් අතුරන අවස්ථාවෙත් ඉල්ලා සිටිය කාපට් ටිකක් හෝ අතුරා දෙන ලෙස.මෙසේ වීමට තිබෙන ගැටළුව කුමක්ද කියා ඇත්ත වශයෙන්ම දන්නෙ නැහැ.සභාපතිතුමා සමඟ කිසිදු තරහවක් නැහැ. නමුත් ගරු සභාපතිතුමාට අපිත් සමග එක්ව යෑමට සංකල්පයක් තිබුණා නම් අපිත් සභාපතිතුමා සමඟ සිටගන්නවා.නමුදු එය එසේ ඉටු වුණේ නැහැ යැයි පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා</u>

6.1km$^2$ක 36228 ක් වූ ජනතාවගේ යහපත හා සුභසිද්ධිය වෙනුවෙන් ඔවුන්ගේ යටිතල පහසුකම් වෙනුවෙන් වූ 2023 වර්ෂයේ අයවැය තමයි අද දින මේ පාණදුර නගර සභාව ඉදිරිපත් කරනු ලබන්නේ.ජනතාව අප මේ සභාවට පත්කරගත්තේ ජනතාවගේ යහපැවැත්ම උදෙසා සුදුසු පාලනයක් ඇතැයි හැඟුණු නිසයි.අපි දේශපාලනමය වශයෙන් තීන්දු තීරණවලට වඩා ඡන්දය දුන් ජනතාවගේ යහපත උදෙසා කටයුතු කරන හෘදසාක්ෂියට එකඟව කටයුතු කරන පුද්ගලයෙකු වශයෙන් තමයි අද දින මෙම සභාව අමතන්නේ.මට දේශපාලනමය තීන්දු අවශ්‍ය නැහැ.තමාට ඡන්දය දුන් ජනතාවක් සිටිනවා , මගේ පක්ෂයට ඡන්දය දුන් ජනතාවක් සිටිනවා,අපිව බලයට පත්කරපු ජනතාවක් සිටිනවා .ඒ ජනතාව ගරු සභාපතිතුමාව,සභාපති වශයෙන් පත්කර ගත්තා .ඒ ජනතාව වෙනුවෙන් කළහැකි සේවයක් මේවන තෙක් තමා ඉටු කර තිබෙන අතර හෘදසාක්ෂියට එකඟව ඒ පිළිබඳව සතුටු වෙනවා.හෘදසාක්ෂියට එකඟව මාගේ කොට්ඨාශයේ විශාල සංවර්ධන කටයුතු රාශියක් ඉටු කර තිබෙනවා.වීථි ලාම්පු ,මංමාවත් ,පාරවල්,කාණු තමන්ට හැකි උපරිම අයුරින් සංවර්ධනය කර තිබෙනවා.මේ සියල්ල ඉටු කරගත්තේ මෙම සභාවේ සභිකයෙක් වශයෙන්.ජනතා අභිලාෂයන් ඉෂ්ට කර ගැනීමට මෙම අයවැය සඳහා අපගේ සහයෝගය ලබාදිය යුතුයි.එමනිසා ඉල්ලා සිටිනවාමන්ත්‍රීවරුන්ගේ හෘදසාක්ෂියට එකඟව අයවැයට ඡන්දය ප්‍රකාශ කරන්න.එමෙන්ම අයවැය සම්බන්ධයෙන් වන ඡන්දය සඳහා රහස්‍ය ඡන්දයක් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වගේම මෙම අයවැය සකස් කිරීම සම්බන්ධයෙන් ලේකම්තුමියටත් ගණකාධිකාරීතුමාටත් එම නිළධාරීන්ටත් ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

අද 2023 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන අයවැය සාකච්ඡාවේදී මූලික වශයෙන්ම මෙම අයවැය ලේඛණය සෑදීම සඳහා මැදිහත් වුණු ගිණුම් අංශයේ චතුරිකා මහත්මියට ගණකාධිකාරීතුමාට හා පරිපාලන නිළධාරීතුමිය වශයෙන් ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළු දෙනාටම මහන්සි වී මෙම අයවැය සකස් කිරීම සම්බන්ධයෙන් ස්තුති වන්ත වෙනවා.

ලංකාවේ පාලනයට අදාළව පාර්ලිමේන්තුව,පළාත් සභාව,ඒ වගේම මේ පළාත් පාලන ආයතන යන සියල්ලම අයවැය ඉදිරිපත් කරල මහජනතාවගේ මුදල් නිසි පරිදි කළමනාකරණය කර නැහැ.අපි කවුරුත් මේ වෙලාවේ එය අත්විඳිමින් සිටිනවා රටේ තිබෙන ආර්ථික අර්බුදයත් සමඟ.ඒ විතරක් නෙමෙයි වංචාව,දූෂණය ,නාස්තිය මේ සියල්ල වැඩිවෙලා.ඒ නිසා අපි දේශපාලන ව්‍යාපාරයක් විදිහටත් තනි තනි පුද්ගලයන් විදිහටත් මේ ක්‍රමය වෙනස් කළ යුතුයි කියා හිතන මිනිස්සු.ඒ වෙනස් කරන්න ඕනේ කියන පදනමේ ඉඳගෙන තීන්දු තීරණ ගන්න මිනිස්සු.

2018 වර්ෂයේ සභාවේ අයවැය ලේඛණයේ දළ වශයෙන් ඇස්තමේන්තුගත ආදායම ලෙස ඉදිරිපත් කර තිබෙනවා ලක්ෂ 2507 ක්.නමුත් උපයගෙන තිබෙනවා ලක්ෂ 2439 ක්.ඒ කියන්නේ ලක්ෂ 158 ක අඩුවක් තිබෙනවා.2019 වර්ෂයේදී එම අඩුව ලක්ෂ 550 ක්.2020 වර්ෂයේදී එම අඩුව ලක්ෂ 590 ක්.2021 වර්ෂයේදී එම අඩුව ලක්ෂ 1054 ක්.2023 වර්ෂයේ ජූනි දක්වා අපට දී ඇති දත්ත අනුව එම අඩුව ලක්ෂ 1878 ක්.ප්‍රතිශතයක් ලෙස ගත්විට 2018 වර්ෂයේ 6% යි.2019 දී අඩුව 21% යි.2020 දී එය 20% යි.2021 දී එම අඩුව 32% යි.2022 ජූනි මාසය වන විට එය 58% ක්.අයවැය ලේඛණ ඉදිරිපත් කරන්නේ අංක හා ඉලක්කම් විදිහට පමණයි.මෙහි ඇති වෙන්කිරීම් ඇත්තටම වෙන්කිරීම්ද? ප්‍රායෝගිකව මේවා සිදු වෙනවාද?උදාහරණයක් ලෙස ගියවර අයවැය විවාදයේදී මේ සභාවේ සියළු සභිකයින්ට ලක්ෂ 10 බැගින් වෙන්කළා.ඇත්තටම ඒවායින් මොනවා හරි වුණා ද? කිහිප දෙනෙක්ගෙ සිදුවී තිබිය හැකියි.හැබැයි බහුතරයකගෙ සිදුවුණේ නැහැ.එමනිසා වෙන්කිරීම් තියෙනවා.නමුත් ඒවා ප්‍රායෝගිකව වෙන දේවල් නෙමෙයි.

අපි මෙම සභාවේ කාර්යක්ෂමතාව වැඩිකිරීම සිදුකළ යුතු බැවින් ඩිජිටල්කරණ ව්‍යාපෘති නොමිලේ ගෙනාවා.සභාවේ සැලැස්ම නැවත සකස් කර කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අපි ව්‍යාපෘති ගෙනාවා.නමුත් මේ කිසිවක් ඉටු වුණේ නැහැ.අපේ පක්ෂයට පාලන බලය නැහැ.සිටින්නේ හතරදෙනයි.තීන්දු තීරණ ගනු ලබන්නේ මේ මුළු සභාවම .නමුත් ඒවා ඉටු කළේ නැහැ.ඒ නිසා අපට ඒකට යම් දායකත්වයක් දෙන්න තිබුණානම් ඒ අවස්ථාව ලැබුනෙ නැහැ.

මෙහි වැදගත්ම කොටස තමයි මෙම අයවැයට පක්ෂව ඡන්දය දෙනවාද විරුද්ධව ඡන්දය දෙනවාද කියා තීන්දුව ගැනීම.කවුරුන් හෝ හිතනවනම් මට ,සභාපතිතුමා ව්‍යාපෘති ටික කරල දුන්න ,නැත්නම් මේ සභාවෙන් කරල දුන්න,ඒ නිසා මේ අයවැයට පක්ෂව ඡන්දය දිය යුතුයි,එහෙමත් නැත්නම් මගේ ව්‍යාපෘති ටික ඉටු කරල දුන්නෙ නැහැ,අකුල් හෙලුව ,බාධා කළා ඒනිසා මෙම අයවැයට විරුද්ධව ඡන්දය දිය යුතුයි කියා තීන්දු ගන්න බවට.ඉතා පැහැදිලිව කියන්න කැමතියි ,නැහැ අපි එහෙම තීන්දු ගන්නෙ නැහැ.අපි ලාභ සිල්ලර ක්‍රමයට පුද්ගලිකකාරණා මත දේශපාලන තීන්දු හෝ අයවැය තීරණ අරගන්නෙ නැහැ.අපි ක්‍රම වෙනස බලාපොරොත්තු වන බැවින් අපි විශ්වාස කරනවා මේ රටේ මොන අයවැය ඉදිරිපත් කළත් පළාත් පාලන වේවා,පළාත් සභා වේවා, ආණ්ඩුව වේවා මහජනතාවගේ ඇත්ත උවමනාවන් අවශ්‍යතාවයන් ඉටු කරන්නෙ නැහැ කියා.එමනිසා සභාවේ අයවැයත් ඒ වගේමයි.ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරන්නේ නැහැ.අන්න ඒ පදනමේ සිට තමයි අපි තීන්දු තීරණ ගන්නෙ.

අයවැය ලේඛණය ජයග්‍රහණය කරනවාද එහෙම නැත්නම් අයවැය විවාදයද යන කාරණය විතරක් නෙමෙයි දැන් මෙය බල කුමන්ත්‍රණයක්.බලය තියාගන්න ,බලය ලබාගන්න, ඉන්න සභාපතිවරයා මාරු කරන්න ,එහෙම නැත්නම් අළුත් සභාපතිවරයෙක් පත්කරන්න යනාදී බල අරගලයක් බවට පත්වෙලා.එමනිසා අපි එම බල අරගලයේ කොටස්කාරයෝ නෙමෙයි.අපි දන්නවා අපිට ආපු දුරකථන ඇමතුම්,කතා කරපු අය.පාරෙදි කවුරුන් එක්ක හෝ හිනාවුණොත් එයාටත් කතා කරල බලනවා අරය මෙම අයවැයට පක්ෂ වෙනවාද විපක්ෂ වෙනවාද කියා.එවන් තැනකට මෙය ඇවිත් තිබෙනවා.එමනිසා එම බලකුමන්ත්‍රණවල කොටස්කාරයෝ නෙමෙයි අපි.අපිට ප්‍රතිපත්තියක් තිබෙනවා,එම ප්‍රතිපත්තියට අනුව තමයි අපි තීන්දු තීරණ ගන්නෙ.ඒ නිසා නිශ්චිතවම අපි කාගෙවත් බලය රැකල දෙන්න හෝ අනේ අපි එයත් එක්ක තරහයි,එයත් එක්ක arrears එකක් තියෙනවා ඒ නිසා අපි එයාව අයින් කරල වෙන කෙනෙක්ව මේ පුටුවෙ ඉන්දවමු කියා බලය අළුතෙන් අරන් දෙන්නවත් අපි මෙතනට ඇවිත් නැහැ.ඒක හරි නිශ්චිතයි.අපි අපේ පක්ෂය තුළ එවැනි කුමන්ත්‍රණකරුවන්ට ඉඩ තියල නැහැ.අපි කුමන්ත්‍රණකාරයන්ව අයින් කරල තියෙනවා.අපි කුමන්ත්‍රණවලට සම්බන්ධ නැහැ.නිශ්චිත දේශපාලන තීන්දු හා නිශ්චිත වගකීම් සහගත තීන්දුයි අපි ගන්නේ.

මේ අයවැය සම්බන්ධයෙන් අපට තියෙන නිශ්චිත අදහස වන්නේ මෙයින්ද මහජන අවශ්‍යතාවයන් ඉෂ්ට නොකරන බවයි.ඒ නිසා ඉතාම කෙටියෙන් හා පැහැදිලිව පැවසිය යුතුයි අපි මේ අයවැය ලේඛණයට පක්ෂව ඡන්දය ලබාදෙන්නේ නැහැ.අපි මෙයට විපක්ෂව ඡන්දය ලබාදෙන්නේ.ඒ නිසා මේ අයවැය ලේඛණයට අදාල බෙදීමේදී අපගේ විරෝදය ප්‍රකාශ කර සිටිනවා.එමෙන්ම නිශ්චිතව මෙම යෝජනාව සඳහා බෙදීමක් ඉල්ලා සිටිනවා මන්ද අපට අපගේ ඡන්දය සලකුණු කර මෙම වාර්තාවේ තිබිය යුතු බැවින්.සියළු දෙනාගේම ඉදිරි වැඩකටයුතු සාර්ථක වේවායි පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා</u>

වසර 05 කට ආසන්න කාලයක් මේ සභාවේ සභිකයින් වශයෙන් ජනතාවට සේවය කරමින් රැඳී සිටියා.පක්ෂයක් ලෙස ජනතාව අපව මෙම සභාවට එවා තිබෙන්නේ ජනතාව වෙනුවෙන් හඬක් නැඟීමට මිස එක් එක් පක්ෂවල ජයග්‍රහණයන් වෙනුවෙන් කටයුතු කිරීමට නොවෙයි.ජනතාව අපෙන් යම් කටයුත්තක් ඉටු කර දෙන ලෙස ඉල්ලූ විට ඔවුන්ගේ පක්ෂය කුමක්ද කියා නොසලකා අපි එම කාර්යය ඉටු කර දී තිබෙනවා.මන්ද අපි පැමිණ තිබෙන්නේ ජනතා සේවයට.කොවිඩ් වසංගත කාලය තුළ පක්ෂයක් වශයෙන් මෙම නගරයේ ජනතාවටත් සභාවේ සේවකයින්ටත් නිළධාරීන්ටත් හැකි අයුරින් සහය වී තිබෙනවා.ජනතාවගේ කසල ගැටළු,වීදි පහන් ගැටළු හා අනෙකුත් ගැටළු අප වෙත ඉදිරිපත් කරන අවස්ථාවන් වලදී එම ගැටළු මෙම සභාවේ නිළධාරීන්ට හා සේවකයින් පවසා ඒවාට විසඳුම් ජනතාව වෙත ලබාදී තිබෙනවා.සභාවක් වශයෙන් එසේ පක්ෂ භේදයකින් තොරව අපට වැඩ කටයුතු පක්ෂයක් ලෙස ඉටු කර ගැනීමට මෙම නගර සභාවේ අවස්ථාව දී තිබෙනවා.එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ලෙස දී තිබෙනවා.නමුදු මෙම සභාවේ අපේ පක්ෂය නියෝජනය කරන හතරදෙනෙකු සිටින අතර අප හතර දෙනාම කිසිදිනක පක්ෂයේ තීන්දු තීරණවලට පිටින් කටයුතු කර නැහැ.

මෙම සභාව හැමදාම ඉතාමත් සහයෝගයෙන් පවත්වාගෙන ගියා.කවදාවත් වතුර බෝතලයකින් ගහගැනීමක් හෝ මේසය උඩ නැගීමක් වැනි කිසිදු දෙයක් මේවන තෙක් මෙම සභාවේ සිදුවී නැහැ.ජනතා සේවකයෝ වශයෙන්ද පක්ෂයක් වශයෙන්ද අප හැමවිටම කටයුතු කරන්නේ ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන්.වසර 74 ක් තිස්සේ මෙම රටේ පාලකයෝ කුමක්ද කළේ කියා ජනතාව දැන් තේරුම්ගෙන තිබෙනවා.පක්ෂවලින් පැන පැන හෝ ජනතාව වෙනුවෙන් කටයුතු කරනවා නම් පුද්ගලයෙකු වශයෙන් ඔහු හොඳයි කියා සලකන්න පුළුවන් නමුදු පක්ෂයක් ලෙස නොවෙයි.අපි රටේත් මේ නගරයේත් කටයුතු කරන කොට අපි ජනතාව පැත්තෙන් සිතා තමයි වැඩ කටයුතු කරන්නේ.ඒ නිසා මෙම සභාවේ කවරෙකු වෙත වැඩක් කිවුවත් ඔවුන් අපිට පවසා නැහැ ලේකම්තුමියගෙන් අහල කියන්නම්,සභාපතිතුමාගෙන් අහල කියන්නම් කියා.ඔවුන් එම කාර්යය ඉටු කර දෙනවා.එමෙන්ම ගරු සභාපතිතුමා හෝ ලේකම්තුමිය එසේ උපදෙස් දී නොමැති අතර කිසිවිටක අපි නීත්‍යානුකූල නොවන ලෙස වැඩ කටයුතු කරන්න කියා පවසා නැහැ.අපි පවසන්නේ ඔවුන්ට නීත්‍යානුකූලව වැඩකරන්න පුළුවන්නම් මේ වැඩේ කරලා දෙන්න කියයි.

එමනිසා ලේකම්තුමිය ඇතුළු සභාවේ නිළධාරීන් , සියළුම සේවක මහත්ම මහත්මීන්ට ස්තූතිවන්ත වෙනවා මේතාක් අප සමඟ රැඳී සිටියාට.අප පක්ෂයේ බලාපොරොත්තුව රටේ බලය ලබාගැනීමටයි.එමනිසා සියළු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ රටේ ඡන්දයක් පවතින අවස්ථාවකදී අපගේ පක්ෂයට ඡන්දය ලබාදී අපහා එක්ව කටයුතු කරන්න කියා ඉල්ලා සිටින බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

2023 අයවැය තමයි අද දින සාකච්ඡා වෙන්නේ.ගරු සභාපතිතුමා විසින් අයවැය සාරාංශය සභාව වෙත ඉදිරිපත් කළා. පුනරාවර්තන වියදමට හා ප්‍රාග්ධන වියදමට පසු අතිරික්තය ලෙස පවතින්නේ -104,860.00 ක් .ඉන්පසු එහි තිබෙනවා අපේක්ෂිත ආදායම ලෙස රු 2,400.00 ක් හා වත්කම් අපහරණයෙන් ලද මුදල් ලෙස රු 150,800.00 ක් ලෙස සඳහන්ව.එම අයිතම 2 එකතු කිරීමෙන් පසුව තමයි අතිරික්තය වශයෙන් රු 48,340.00 ක් ලැබී තිබෙන්නේ.එමනිසා ගණකාධිකාරීතුමා මේ අවස්ථාවේ සහභාගී වන බැවින් මේ අයිතම මොනවාද යන්න දැනගැනීමට අවශ්‍ය බව පවසා සිටින ලදී.

**පෙ.ව.11.30 - ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ගරු සභාව , කාරක සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.**

**පෙ.ව. 11.50 - ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කාරක සභාව ,ගරු සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව,ගරු සභා අවස්ථාවට පත්වන ලදී.**

ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

ගරු සභාපතිතුමා පවසා සිටියා ස්ථාවර තැන්පතු වශයෙන් ලක්ෂ 1300 ක් පමණ පවතිනවා කියා.සභාවේ ගොඩනැගිලි තිබෙනවා වැඩ අවසන් කළ යුතු.එමනිසා මීළඟ සභාවකට මෙම මුදල් නාස්ති කිරීමට නොතබා එම මුදල් වලින් මෙම සභාවේ ගොඩනැගිලි වල වැඩ අවසන් කිරීමට කටයුතු කරන්න. පාණදුර ක්‍රීඩා සමාජය සමඟ සභිකයින් සාකච්ඡාවකට යොමු වූ නමුදු ඉන්පසු කිසිදු දෙයක් ඒ සම්බන්ධයෙන් ඉටු වුණේ නැහැ.එමනිසා නැවත සාකච්ඡාවක් කැඳවමින් හෝ ක්‍රීඩා සමාජයේ සහයද ගරු සභාපතිතුමාගේ දැනහඳුනාගැනීම් ප්‍රයෝජනයට ගනිමින්ද මෙම ක්‍රීඩා පිට්ටනිය හා ඒවටා සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු බැවින් ගරු සභාපතිතුමාට ඒ සඳහා මැදිහත් වන ලෙස පවසා සිටින ලදී.මීළගට මිනුවම්පිටිය සුසාන භූමිය සභාව සතු වටිනා සම්පතක් නමුදු එයින්ද කිසිදු ප්‍රයෝජනයක් ගන්නේ නැහැ.එහි තිබෙන පරණ ගොඩනැගිල්ල ඉවත් කර එහිද නව ගොඩනැගිල්ලක් සාදා එය අලංකාරව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

මේවන විට මැතිවරණ කොමිෂන් සභාව පවසා තිබෙනවා මීළඟ පළාත් පාලන ඡන්දය පැවැත්විය හැකි බව.එමෙන්ම නීතිපතිතුමාද පවසා තිබෙනවා මැතිවරණය පැවැත්වීමට කිසිදු බාධාවක් නොමැති බව.නමුදු අපිට ලැබෙන තොරතුරු අනුව ගරු සභාපතිතුමාගේ නායකයා වන ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මේවන විට පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් 134 දෙනෙකුගේ සිරකරුවෙකු බවට පත්වී තිබෙනවා.එම මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේ ඡන්දය ඉල්ලමින් ගෙයින් ගෙට යානොහැකි බැවින් ඔවුන් ජනාධිපතිතුමන්ගෙන් ඉල්ලා සිටිනවා මෙම පළාත් පාලන ඡන්දය වසර 02 කින් කල් දමන්න කියා.එම ඉල්ලීමට රනිල් වික්‍රමසිංහ මහතාට යටවෙන්න සිද්ධ වී තිබෙනවා.මන්ද එසේ නොවුනොත් එතුමාට වසර 02 ක ජනාධිපති ධූරයේ සිටින්න බැරිවෙනවා.එසේ බලන විට මැතිවරණය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි බවක් නැහැ.

කෙසේ හෝ මෙම අයවැය පාණදුර නගර සභාවේ වත්මන් පාලක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ රජයේ නියෝජිතයා ලෙස පත්වී තිබෙන පාණදුර නගර සභාවේ සභාපති පාණදුර

එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක නන්දන ගුණතිලක මහතාගේ අයවැයක් වශයෙන් තමයි අපි මෙම අයවැය පිළිගන්නේ.එමනිසා පක්ෂයක් වශයෙන් තීන්දුවක් ගෙන තිබෙනවා ගරු සභාපතිතුමාට විරුද්ධව නොවෙයි එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයාගේ අයවැය ලේඛණයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනවා යැයි පවසා සිටින ලදී.

**සභා සම්මුතිය :** විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා විසින් බෙදීමක් ඉල්ලන ලදී. ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් අයවැය සඳහා ඡන්ද විමසීම , රහසාා ඡන්දයකින් පවත්වන ලෙස යෝජනා කරන ලද අතර අදාළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමා විසින් අයවැය ඡන්ද විමසීම රහසාා ඡන්දයකින් පවත්වන්නේද නැද්ද යන්න විමසීම සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදී.

<u>අයවැය සඳහා වූ ඡන්දය විමසීම රහසාා ඡන්දයකින් පැවැත්විය යුතු බවට වූ යෝජනාවට පක්ෂව</u>

1.එම්.ඩී.නන්දන ගුණතිලක මහතා - ගරු සභාපති

2. ජානක සොයිසා වික්‍රමසිංහ මහතා - ගරු නාගරික මන්ත්‍රී

3.විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා - ගරු නාගරික මන්ත්‍රී

4. අශෝකා රත්නමාලි මිය - ගරු නාගරික මන්ත්‍රී

5. කුමුදු ප්‍රනාන්දු මහතා - ගරු නාගරික මන්ත්‍රී

6. ලලිත් හසන්ත රුද්‍රිගෝ මහතා - ගරු නාගරික මන්ත්‍රී

7. පද්මා කොස්තා මිය - ගරු නාගරික මන්ත්‍රී

8. පුෂ්පා ෆොන්සේකා මිය - ගරු නාගරික මන්ත්‍රී

9. ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය - ගරු නාගරික මන්ත්‍රී

<u>අයවැය සඳහා වූ ඡන්දය විමසීම රහසාා ඡන්දයකින් පැවැත්විය යුතු බවට වූ යෝජනාවට විපක්ෂව</u>

1. පී.එච්.විල්මන් මහතා - ගරු උපසභාපති

2.රජීව සංජය වීරමන් මහතා - ගරු නාගරික මන්ත්‍රී

3.පියසේන ප්‍රනාන්දු මහතා - ගරු නාගරික මන්ත්‍රී

4. කමල්සිරි ප්‍රනාන්දු මහතා - ගරු නාගරික මන්ත්‍රී

5. මහින්ද පුන්සිරි මහතා - ගරු නාගරික මන්ත්‍රී

6. එච්.චන්දිම ඒ.පීරිස් මහතා - ගරු නාගරික මන්ත්‍රී

7. ගයා උදයංගනී මිය - ගරු නාගරික මන්ත්‍රී

8. ආර්.බන්දුල සොයිසා මහතා - ගරු නාගරික මන්ත්‍රී

9.එම්.පද්මසිරි සිල්වා මහතා - ගරු නාගරික මන්ත්‍රී

සභා රීතීන් අනුව අයවැය සඳහා වූ ඡන්දය විමසීම රහස්‍ය ඡන්දයකින් පැවැත්විය යුතු බවට වූ යෝජනාවට ලබාගත් පක්ෂ හා විපක්ෂ ඡන්ද ප්‍රමාණය සමාන වීම හේතුකොට ගෙන ගරු සභාපතිතුමාගේ තීරක ඡන්දය විමසා සිටි අතර ගරු සභාපතිතුමා විසින් තීරක ඡන්දය , අයවැය සඳහා වූ ඡන්දය විමසීම රහස්‍ය ඡන්දයකින් පැවැත්විය යුතු බවට වූ යෝජනාවට පක්ෂව ලබාදෙන ලදී.ඒ අනුව පක්ෂව වැඩි ඡන්ද 01 කින් 2023 වර්ෂයේ අයවැය සඳහා වූ ඡන්ද විමසීම රහස්‍ය ඡන්දයකින් පැවැත්විය යුතු බවට තීරණය විය.

ඒ අනුව පැවති රහස් ඡන්දයේ ප්‍රතිඵලය වශයන් ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද පහත වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 18

ඡන්දය ප්‍රකාශ කරන ලද සභිකයින් :

1.ගරු සභාපති - එම්.ඩී.නන්දන ගුණතිලක මහතා

2. ගරු උපසභාපති - පී.එච්.විල්මන් මහතා

3. ගරු නාගරික මන්ත්‍රී - රජීව සංජය වීරමන් මහතා

4. ගරු නාගරික මන්ත්‍රී - අයි.ජානක උදයවර්ණ සොයිසා වික්‍රමසිංහ මහතා

5. ගරු නාගරික මන්ත්‍රී - විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

6. ගරු නාගරික මන්ත්‍රී - එම්.පියසේන ප්‍රනාන්දු මහතා

7. ගරු නාගරික මන්ත්‍රී _ කේ.ඩී.අශෝකා රත්නමාලි මහත්මිය

8. ගරු නාගරික මන්ත්‍රී _ එම්.කුමුදු ප්‍රනාන්දු මහතා

9. ගරු නාගරික මන්ත්‍රී - කමල්සිරි ප්‍රනාන්දු මහතා

10. ගරු නාගරික මන්ත්‍රී - ලලිත් හසන්ත රුද්‍රිගෝ මහතා

11. ගරු නාගරික මන්ත්‍රී _ එච්.ඩී.මහින්ද පුන්සිරි මහතා

12. ගරු නාගරික මන්ත්‍රී _ පද්මා සමරදිවාකර කොස්තා මහත්මිය

13. ගරු නාගරික මන්ත්‍රී _ පුෂ්පා ෆොන්සේකා මහත්මිය

14. ගරු නාගරික මන්ත්‍රී _ එච්.චන්දිම ජ්.පීරිස් මහතා

15. ගරු නාගරික මන්ත්‍රී _ ගයා උදයංගනී මහත්මිය

16. ගරු නාගරික මන්ත්‍රී _ එච්.ආර්.බන්දුල සොයිසා මහතා

17.ගරු නාගරික මන්ත්‍රී _ එම්.පද්මසිරි සිල්වා මහතා

18. ගරු නාගරික මන්ත්‍රී _ ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මහත්මිය

ප්‍රකාශිත ඡන්ද වලින් වලංගු ඡන්ද සංඛ්‍යාව - 17

2023 අයවැය සඳහා පක්ෂව ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 10

2023 අයවැය සඳහා විපක්ෂව ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 07

අවලංගු කරන ලද ඡන්ද සංඛ්‍යාව - 01

නොපැමිණි සභිකයින් - නැත

**ඒ අනුව පක්ෂව වැඩි ඡන්ද 03 කින් නගර සභා ආඥා පනතේ 178 වගන්තිය යටතේ හා අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දාතමින් යුත් අතිවිශේෂ ගැසට් පත්‍රයේ 26 වන රීතිය මඟින් පනවා ඇති නියෝග අනුව සකස් කරන ලද සංවර්ධන, පරිපාලන හා සමාජ සුභ සාධන යෝජනා සහිත ආදායම් වියදම් ඇස්තමේන්තු ඇතුළත් පාණදුර නගර සභාවේ 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය සභා සම්මත විය.**

**(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම - නැත**

**(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම - නැත**

**(එ) අංශ ප්‍රගතිය සලකා බැලීම - නැත**

ගරු සභාපතිතුමා

මෙය නගරයේ කටයුතු කෙසේ පවත්වාගෙන යා යුතුද යන්න තීරණ අරගෙන ක්‍රියාකරන සභාවක්.මේ අපි හැමෝම 6.1 km$^2$ වූ නගර සභා සීමාවේ ජීවත් වන පුරවැසියෝ.කාලයක් තිස්සේ හමුවන මිතුරකම් පැවතුණු ඉතිහාසය පුරා හමුවුණ තවමත් හමුවන පුරවැසියො.එමෙන්ම පුරවැසියන්ගේ ඡන්දයෙන් තේරී පත්වූ අය.එමනිසා දේශපාලන මතිමතාන්තර අනුව බෙදීම් සිදුවිය හැකියි.එය සාමාන්‍ය දෙයක්.හැබැයි දේශපාලන මතිමතාන්තර ඉක්මවා ගිය බෙදීම්ද සිදුවිය හැකියි.පාර්ලිමේන්තුවෙත් එවන් දේ දැකිය හැකියි.මෙහි සිදුවූ බෙදීම ඇතුළේ ප්‍රකාශ වෙච්ච ඡන්ද වලින් අපේ අනාගතය තීරණය වෙන්න අවශ්‍ය නැහැ.අපි කවුරුත් කලින් සිටියා වගේම මේ නගර සභාවට ජනතාව තෝරා පත්කරපු ගරු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් විදිහට හැම කෙනාටම අයිතිය තිබෙනවා මේ නගර සභාව උපයන ආදායම කළමනාකරණය කරන්නේ කෙසේද යන කාරණය තීරණය කරන්න.වියදම් කරන්නේ කෙසේද කියා තීරණය කරන්න.ගියවර අයවැය අවස්ථාවේදීත් විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා.ඒසේ තිබියදීත් විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ අයට දේශපාලනමය වශයෙනුත් පරිපාලනමය වශයෙනුත් කිසිදු විරුද්ධතාවයක් දැක්වූයේ නැහැ.සාධාරණව කටයුතු කළා.ගියවර ආණ්ඩු පක්ෂයේ තිදෙනෙක්ම විරුද්ධ ඡන්දය ප්‍රකාශ කළා.ඒ තිදෙනාට පක්ෂය විසින් ගෙන ගිය ක්‍රියාමාර්ග අතරමඟ අපි නතර කළා.මන්ද ඔවුනුත් ඡන්දෙන් පත්වෙලා ආපු අය.ඒවගේම දීර්ඝ කාලයක් දේශපාලනය කරපු අය බැවින් ආණ්ඩුපක්ෂයේ ඉතිරි සාමාජිකයන් සාකච්ඡා කර තීරණයක් ගත්තා පක්ෂය විසින් ගත්ත විනය කටයුත්ත අඛණ්ඩව පවත්වාගෙන නොයාමට.අපි කවුරුත් ඉතිරි කාලයේ ජනතාවගේ විවිධ බලාපොරොත්තු සහිතව ඡන්දය

දී පත්කර එවපු අය වශයෙන් නගර සභාව වඩාත් යහපත් තැනක් බවට පත්කිරීමට තවදුරටත් එක්ව කටයුතු කරමු. ලබන වසර මීටත් වඩා සාර්ථකව කටයුතු කරන්න ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් හා 2022.12.15 වන දින විශේෂ මහා සභා න්‍යාය පත්‍රයට අනුව නියමිත කරුණු එපමණක් වූයෙන් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට තම ස්තූතිය පුද කරමින් 2022 දෙසැම්බර් මස 15 වන දින මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 01.15 නිමාවට පත් විය.

සභාපති,
නගර සභාව,
පාණදුර.
දිනය:

ඇම්.ඩී. නන්දන ගුණතිලක
සභාපති
පානදුර නගර සභාව

ලේකම්
නගර සභාව,
පාණදුර
දිනය: 2022.12.30

ටී. මාහෙල් සියඹලාගොඩ
ලේකම්
පානදුර නගර සභාව